සිකුරාදා

පළමුවන කියැවීම

එසෙකියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

එසෙකියෙල් 18: 21–28

"දුෂ්ඨයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත්වීම මිස ඔහු නැසී යාම මාගේ සතුට නොවේ.

"දුෂ්ඨයා තමා කළ සියලු පාපවලින් හැරී, මාගේ සියලු පණත් පවත්වමින්, නීති ගරුකව ද අවංකව ද සිටියොත් ඔහු සැබැවින්ම නොනැසී ජීවත් වන්නේය. ඔහු කළ ඔහුගේ සියලු වරද ඔහුට විරුද්ධව සිහි නොකරනු ලැබේ. ඔහු කළ ඔහුගේ ධර්මිෂ්ඨකම නිසා ඔහු ජීවත් වන්නේය. දුෂ්ඨයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත් වීම මිස ඔහු නැසී යාම කිසි ලෙසකින් වත් මට සතුටක් වනු ඇද්දැ"යි මහෝත්තම දෙව් ස්වාමීන් වහන්සේ අසන සේක.

"එහෙත් ධර්මිෂ්ඨයෙක් තමාගේ ධර්මිෂ්ඨකමෙන් හැරී, අධර්මිෂ්ඨකම් කොට, දුෂ්ඨයා කරන සියලුම පිළිකුල් ක්‍රියා කලොත් ඔහු ජීවත් වේ ද? ඔහු කළ ඔහුගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලින් කිසිවක් සිහි කරනු නොලැබේ. ඔහු කළ ඔහුගේ ද්‍රෝහිකම් නිසාත්, ඔහු කළ ඔහුගේ පාප නිසාත් ඔහු නසින්නේ ය. 'එහෙත් සමිඳාණන් වහන්සේගේ ක්‍රියා ආසාධාරණ ය'යි නුඹලා කියන්නහු ය. අහෝ ඉශ්‍රායෙල්වරුනි, අසන්න. මාගේ ක්‍රියා සාධාරණ නොවේ ද? සාධාරණ නැත්තේ නුඹලාගේ ක්‍රියා නොවේ ද? ධර්මිෂ්ඨයෙකු තමාගේ ධර්මිෂ්ඨකමින් හැරී, අධර්මිෂ්ඨකම් කරමින් සිට නසින කල ඔහු නසින්නේ තමාගේ අධර්මිෂ්ඨකම් නිසා ය. යළිත් දුෂ්ඨයා තමා කළ දුෂ්ඨකමෙන් හැරී, නීතිගරුකව ද අවංකව ද සිටින කල ඔහු

තමාගේ ජීවිතය රැක ගන්නේය. ඔහු වරද තේරුම් ගෙන තමාගේ සියලුම වැරදිවලින් හැරෙන නිසා ඔහු නොනැසී ජීවත් වන්නේ ම ය.

දේව වාක්‍යය එසේය.

පිලිතුරු ගීය

ගීතාවලිය 130 : 1–8

පිලිතුර: සමිඳුනි ඔබ අපගේ අයුතුකම් ගණන් ගන්නා සේක් නම් කාට ගැලවිය හැකි ද?

ගීය:

සමිඳුනි, දුක් සයුරේ සිට මම ඔබට මොර ගසමි.
සමිඳුනි, මාගේ හඬට සවන් දුන මැනව. මාගේ කන්නලව්වට සවන් යොමු කළ මැනව.
සමිඳුනි, ඔබ අපේ යුතුකම් සටහන් කර තබන සේක් නම් විනිශ්චයෙන් බේරෙන්නට පුළුවන් කවරෙකුට ද?

එහෙත් ඔබ කෙරෙහි ගරු බියෙන් සිටින පිණිස ඔබ අපට කමාව දෙන සේක. මම සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටිමි. එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමි.

පහන් වනතුරු බලා සිටින මුරකරුන්ට වඩා, එසේය, එළිය වැටනතුරු බලා සිටින මුරකරුන්ට වඩා මම සමිඳුන් එනතුරු බලා සිටිමි. එම්බා ඉශ්‍රායෙල් ජනයෙනි සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න. මන්ද, සමිඳුන්ගේ ප්‍රේමය තිරසර ය.

ගැලවීම මුළුමනින් ම එතුමන් අතෙහි ය. එතුමාණෝ ඉශ්රායෙල් ජනයා ඔවුන්ගේ පාප සියල්ලෙන් මුදා හරින සේක.

සාධුකාරය

"මනස්ථාපනය වන්න. ස්වර්ග රාජ්‍යය ආසන්න ය."

සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 5 : 20–26

"පළමුකොට සහෝදරයා හා සමගි වී, පසුව අවුත් පඬුර පූදන්න."

"ඔහු ධර්මිෂ්ඨකමින් විනයධරයන් ද පරිසිවරුන් ද ඉක්මවා නොගියොත්, ඔබ කිසිසේත් ස්වර්ග රාජ්‍යයට නොපිවිසෙන්නහු ය"යි ඔබට කියමි.

"මිනී නොමරන්න. මිනී නොමරන කවරෙකු වුව ද විනිශ්චයට යටත් වනු ඇතැ"යි පැරැන්නන්ට කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. තමාගේ සහෝදරයා සමග කෝපවන කවරෙකු වුව ද ඔහු අධිකරණයට යටත් වනු ඇත. තමාගේ සහෝදරයාට 'මෝඩයා' කියා ගරහන කවරකු වුව ද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත. 'ජඩයා' කියා ගරහන කවරකු වුව ද ඔහු නිරාගින්නට ගොදුරු වනු ඇත. එබැවින් ඔබ පූජාසනය වෙත පඬුරක් ගෙනෙන කල ඔබේ සහෝදරයා ඔබට විරුද්ධව යම්කිසි අමනාපයක් ඇතිව සිටින බව එහිදී සිහිවී නම් පඬුර පූජාසනය ඉදිරියේ තබා ගොස් පළමුකොට සහෝදරයා හා සමගි වී පසුව අවුත්

පඬුර පුදන්න. ඔබේ විරුද්ධකාරයා සමග උසාවියට යන කල මඟදීම ඉක්මනින් ඔහු හා සමගි වන්න. නැත්නම් විරුද්ධකාරයා ඔබ නඩුකාරයාට භාර දෙන්නේය. නඩුකාරයා ඔබ උසාවියේ නිලධාරියාට භාර දෙන්නේය. ඔබ ද සිරගෙයි දමනු ලබන්නෙහි ය. සැබැවින්ම මම ඔබට කියමි. අන්තිම සතයට ම දඩය ගෙවන තෙක් ඔබ කිසිසේත් එයින් පිට වී නොයන්නෙහි ය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.